# ආයතනගත මානසික අවපීඩනයට ලක්වූවන් සම්බන්ධයෙන් පවත්නා සමාජ ලේබල් කිරීම් පිළිබඳ මනෝ සමාජයීය අධ්‍යයනයක්

ඩී.බී.පී.එස්. චන්ද්‍රසිරි - සමාජවිද්‍යා අධ්‍යයනාංශය

පුද්ගලයා අගතියට පත්කිරීම හෝ වෙනස් කොට සැලකීම ලේබල්කරණය ලෙස හඳුන්වයි. **මානසික අවපීඩනය** වෛද්‍ය විද්‍යාව තුළ මානසික රෝගී තත්වයක් ලෙස අර්ථ දක්වා ඇත. එමගින් වින්දිතයන් වූ ප්‍රජාව සාමාන්‍ය සමාජයෙහි මෙන්ම **ආයතනගත**ව ද පීඩාවට ලක් වේ. මහා සමාජය ඔවුන් වෙත නිශේධනාත්මක ප්‍රතිචාර දැක්වීමත්, සමාජයීය වශයෙන් එම පිරිස් **ආන්තීකරණය**ට මෙන්ම කැළලට ලක් කිරීමත් බොහෝ සෙයින් සිදු වේ. මෙවන් පසුබිමක ආයතනගත මානසික අවපීඩනයට ලක් වූවන් **ලේබල්කරණය**ට ලක්වන්නේ කෙසේද? යන ගැටලුව සම්බන්ධයෙන් මනෝ-සමාජයීය වශයෙන් කතිකාවක් ගොඩනැගීමේ අවශ්‍යතාව අන් කවරදාටත් වඩා මතුව ඇත. ඒ අනුව මානසික අවපීඩනයට ලක්වූවන් සමාජයීය වශයෙන් ලේබල්කරණයට ලක්වන ආකාරය මෙන්ම ඔවුන් පිළිබඳ සමාජය දරන්න ආකල්ප අවම කිරීමට ගත හැකි යාන්ත්‍රණය ආදීවූ අරමුණු පිළිබඳව පර්යේෂණයේදී අවධානය යොමු කරන ලදී. මුල්ලේරියාව සෞඛ්‍ය වෛද්‍ය ආයතනය පර්යේෂණ ක්ෂේත්‍රය බවට පත් කර ගනිමින් අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ උග්‍ර මානසික අවපීඩන තත්වයෙන් පීඩාවිඳින කාන්තා ප්‍රතිචාරිකයන් 10 දෙනෙකු ඇසුරින් මෙන්ම මීට සමගාමීව ආයතනය තුළ සේවයේ නියුතු සමාජ කාර්යවේදියෙකුද නියැදිය සඳහා අන්තර්ගත කර ගන්නා ලදී. ඒ අනුව සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය මෙන්ම ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමය යටතේ තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යොදා ගනු ලැබීය. අධිපති සමාජයට සාපේක්ෂව ආයතනගත කිරීම තුළ ආයතන ආශ්‍රිතව පවත්නා සංකීර්ණ ධූරාවලි හේතුකොටගෙන සේවාලාභීන් ලේබල්කරණයට ලක් වේ. සමාජ අන්තර්ක්‍රියාවලදී එකිනෙකා ආමන්ත්‍රණය කිරීම සඳහා වන ආධාරක වචන මාලා අගතිමය ප්‍රකාශන අන්තර්ගත වීමෙන් සේවාලාභීන් වාචික වශයෙන් ලේබල්කරණය වන බව හඳුනාගත හැකිය. මේ හේතුව මත සමාජ කාර්යවේදියාගේ කාර්යභාරය සුවිශේෂ වේ. මන්දයත් සමාජ කාර්යවේදියා අධිපති සමාජය සහ ආයතනගත රාමු අතර සම්බන්ධීකාරකයෙකු බවට පත්වීමෙන් ආයතනගත රාමුව තුළ පවා ඔහු මානසික අවපීඩනයට ලක්වූවන්ගේ සමාජ සුබාර්ථය සඳහා කරන මෙහෙය සුවිශේෂ වේ. එම නිසා මානසික අවපීඩනයෙන් වින්දිතයන් වූවන් සමාජයෙන් වෙනස් කොට සැලකීම අවම කොට එම ප්‍රජාව **බලගැන්වීම** කෙරෙහි දායකත්වය දැක්වීම සඳහා සමාජ කාර්යවේදියාගේ මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ

***ප්‍රමුඛ පදඃ*** *මානසික අවපීඩනය, ආන්තීකරණය, ලේබල්කරණය*